# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/52 - 2016 මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2016.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නියෝගය මගින් එකී පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.04.29 වැනි දිනැති අංක 1964/70 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනය, පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මැයි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

2016.04.29 දිනැති අංක 1964/70 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* උපලේඛනයෙහි අයිතම 1 (ඇ) ට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කරමින්,

| *අංකය* I | | *විස්තරය* II | *නිෂ්පාදන බද්ද* III |
|---|---|---|---|
| 1 | (ඉ) | ආනයනය කරනු ලබන මෝටර් රථ,<br>අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන පරිදි රට වෙනුවෙන් විශිෂ්ඨ සේවාවක් ඉටු කරන ලද කිසියම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන හෝ එබඳු පුද්ගලයන්හට පරිත්‍යාග වශයෙන් ලැබෙන<br>2015.11.20 දින හෝ ඊට පෙර සහනදායි බලපත්‍ර නිකුත් කරන ලද සහ 2015.12.31 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කරන ලද සඳහා | 2015.02.26 දිනැති අංක 1903/39 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු බදු ප්‍රමාණයන් |

06 - 192

1A - PG 2959 — 507 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*